NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණය | ඒකකය : 5 ගිණුම්කරණ සමීකරණය |
|---|---|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

(1) නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.
1) වත්කම = හිමිකම – වගකීම්
2) හිමිකම = වත්කම් + වගකීම්
3) වත්කම් = හිමිකම + වගකීම්
4) වත්කම් = වගකීම් – හිමිකම

(2) ව්‍යාපාරයක වත්කම් හා හිමිකම් වැඩිවන ගනුදෙනුවක් වන්නේ,
1) සේවකයන්ට වැටුප් ගෙව්වා රු. 10 000/=
2) අයිතිකරු ව්‍යාපාරයට අමතර ප්‍රාග්ධනය යෙදුවා රු. 100 000/=
3) අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් රු. 10 000/= ලබා ගැනීම.
4) බැංකුවෙන් ණයක් ගැනීම රු. 200 000/=

(3) ව්‍යාපාරය බාහිර පාර්ශවයෙන් ලබා ගන්නා සම්පත්,
1) හිමිකමකි
2) වගකීමකි
3) උරුමයකි
4) වත්කමකි

(4) ව්‍යාපාරයක ජංගම නොවන වත්කමකි,
1) බැංකු ණය
2) භාණ්ඩ තොගය
3) ලී බඩු
4) ණයගැතියෝ

(5) ව්‍යාපාරයක ජංගම වගකීමක් දක්වෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,
1) උකස් ණය / කල්බදු ණය / බැංකු ණය / ණය හිමියෝ
2) ණය හිමියෝ / බැංකු අයිරාව / බැංකු ණය / ණය ගැතියෝ
3) ණය හිමියෝ / බැංකු අයිරාව / ගෙවිය යුතු බිල්පත් / කෙටිකාලීන ණය
4) ලී බඩු / කල්බදු ණය / ආයෝජන / ණයගැතියෝ

(6) ව්‍යාපාරයක හිමිකම වැඩිවීමට බලපාන කරුණකි.
1) ව්‍යාපාරික වියදම්
2) අමතර ප්‍රාග්ධනය
3) ගැනිලි
4) ඉහත සියල්ලම

(7) ව්‍යාපාරයක වත්කමක ලක්ෂණයක් නොවන්නේ,
1) අනාගතයේදී ව්‍යාපාරයට ප්‍රතිලාභ ගලා ඒම.
2) ව්‍යාපාරයේ පාලනයට නතු වීම.
3) අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම.
4) නැවත ගෙවීමකදී සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා යාම.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

(8) 2019. 01. 31 දිනට සරණිගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වනුයේ,

| වත්කම් (රු) | = | හිමිකම (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|
| 75 000 | = | 60 000 | + | 15 000 |

සරණි අමතර ප්‍රාග්ධනය ලෙස රු. 10 000 යෙදූ විට නව ගිණුම්කරණ සමීකරණය වනුයේ,

1) රු. 85 000 = රු. 70 000 + රු. 15 000
2) රු. 85 000 = රු. 60 000 + රු. 25 000
3) රු. 75 000 = රු. 50 000 + රු. 25 000
4) රු. 65 000 = රු. 60 000 + රු. 5 000

(9) ව්‍යාපාරයක සිදු වූ ගණුදෙණුවක්, ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දක්වා ඇත.

| වත්කම් (රු) | = | හිමිකම (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|
| +10 000 | = | – | + | 10 000 |

සිදුවී ඇතැයි සිතිය හැකි ගණුදෙණුව තෝරන්න.

1) අයිතිකරු ව්‍යාපාරයෙන් රු. 10 000 ක් ආපසු ලබා ගැනීම.
2) අයිතිකරු ව්‍යාපාරයට රු. 10 000 ක අමතර ප්‍රාග්ධනයක් යෙදීම.
3) ව්‍යාපාරය රු. 10 000 ක ණය මුදලක් ලබා ගැනීම.
4) ව්‍යාපාරය රු. 10 000 ක වියදමක් දැරීම.

(10) ව්‍යාපාරයක හිමිකම හා වත්කම යන අයිතම දෙකෙහිම වටිනාකම අඩුවීමට බලපාන ගණුදෙණුවකි.

1) රු. 25 000 ක අමතර ප්‍රාග්ධනය යෙදවීම.
2) රු. 10 000 ක විදුලිබිල ගෙවීම.
3) රු. 15 000 ක ගෙවල් කුලී ආදායම් ලැබීම.
4) රු. 10 000 ක මුදලක් ණය හිමියන්ට ගෙවීම.

agaram.lk

(11) ව්‍යාපාරයක ප්‍රාග්ධනය ගණනය කළ හැක්කේ කුමකින් ද?

1) ලාභය + වත්කම්
2) වත්කම + වගකීම
3) ලාභය – වගකීම
4) වත්කම – වගකීම්

(12) ගිණුම්කරණයට අදාල 10 ශ්‍රේණියේ ශිෂ්‍යයන් ඉදිරිපත් කල පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත්ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) වියදම් නිසා වගකීම් අඩු වේ.
2) ගැනිලි නිසා හිමිකම් අඩු වේ.
3) බැංකු අයිරාව වත්කමකි.
4) වගකීම් නිදහස් කළ නොහැකිය.

- 2018 ජනවාරි මාසයේ තාරකාගේ ව්‍යාපාරයේ පහත ගනුදෙණු සිදු විය.

A – රු. 2 000 ක දුරකථන ගාස්තුවක් ගෙවීම.

B – ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 30 000 ක කාර්යාල උපකරණ දෙරණ සමාගමෙන් ණයට ගැනීම.

C – රු. 25 000 ක භාණ්ඩ සමන්ට විකිණීම.

D – රු. 5 000 ක භාණ්ඩ තාරකා තම පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගැනීම.

(13) A ගණුදෙනුව නිසා ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම වනුයේ,

1) වත්කම් වැඩිවීම, හිමිකම් අඩුවීම.
2) වත්කම් අඩු වීම, වගකීම් වැඩි වීම.
3) වත්කම් අඩු වීම, හිමිකම් අඩුවීම.
4) වත්කම අඩුවීම, වගකීම් අඩුවීම.

(14) B ගණුදෙනුව නිසා ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම වනුයේ,

1) වත්කම් වැඩිවීම, වගකීම් වැඩිවීම.
2) වත්කම් වැඩිවීම, හිමිකම් වැඩි වීම.
3) වත්කම් අඩු වීම, වගකීම් අඩුවීම.
4) වත්කම අඩුවීම, වගකීම් අඩුවීම.

(15) C ගණුදෙනුව,

1) අත්පිට විකිණීමකි.
2) ණයට විකිණීමකි.
3) අත්පිට ගැනීමකි.
4) ණයට ගැනීමකි.

(16) රුචිරගේ ව්‍යාපාරයේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| 2018 වර්ෂය තුළ යෙදූ අමතර ප්‍රාග්ධනය | 50 000 |
| වර්ෂය තුළ වියදම් | 25 000 |
| වර්ෂය තුළ ආදායම් | 60 000 |
| 2018. 12. 31 දිනට හිමිකම් | 2 25 000 |

රුචිරගේ ව්‍යාපාරයේ 2018. 01. 01 දිනට හිමිකම කොපමණ ද?

1) රු. 310 000  2) රු. 275 000  3) රු. 140 000  4) රු. 335 000

- හිස්තැන් පුරවන්න.

(17) වත්කම = හිමිකම + වගකීම

රු. ................ = රු. 120 000 + රු. 100 000

(18) වගකීම් = වත්කම් – හිමිකම

රු. ................ = රු. 160 000 – රු. ................

(19) හිමිකම = වත්කම – වගකීම්

රු. 25 000 = රු. ................ – රු. 25 000

(20) වත්කම = හිමිකම + වගකීම්

රු. 300 000 = රු. ................ + රු. 50 000

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

## II කොටස

(1) 1) ගිණුම්කරණ සමීකරණය හඳුන්වන්න.

.......................................................................................................................

.......................................................................................................................

2) සමිතුගේ ව්‍යාපාරයේ 2018. 01. 01 දිනට පහත ශේෂ දක්නට ලැබුණි.

| | රු. |
|---|---|
| මෝටර් රථ | 250 000 |
| භාණ්ඩ තොගය | 25 000 |
| මුදල් | 15 000 |
| බැංකු ණය | 75 000 |
| ණයහිමියෝ | 30 000 |
| ප්‍රාග්ධනය | 185 000 |

මාසය තුල සිදු වු ගණුදෙනු පහත දැක්වේ.

1) අයිතිකරු විසින් අමතර ප්‍රාග්ධනය ලෙස රු. 65 000 ක් යෙදවීම.
2) රු. 50 000 ක භාණ්ඩ තොගයක් ණය පදනම මත මිලට ගැනීම.
3) ණයහිමියන්ට රු. 25 000 ගෙවීම.
4) රු. 40 000 ක් වටිනා අයිතිකරුගේ පෞද්ගලික යතුරු පැදිය ව්‍යාපාරයට යෙදවීම.
5) රක්ෂණ ගාස්තු ගෙව්වා රු. 10 000.
6) රු. 35 000 ක පිරිවැය භාණ්ඩ තොගයක් රු. 45 000 කට විකිණීම.
7) ගෙවල් කුලී ආදායම් ලෙස රු. 18 000 ලැබීම.
8) අයිතිකරුගේ නිවසේ විදුලි බිල ව්‍යාපාරයේ මුදලින් ගෙව්වා රු. 5 000.
9) බැංකු ණය ආපසු ගෙව්වා රු. 10 000.
10) අත්පිට ගැනුම් රු. 50 000

**අවශ්‍ය වන්නේ,**

i) ඉහත සඳහන් ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වටිනාකම් සහිතව දක්වන්න. පිළිතුරු සැපයීමේ දී පහත ආකෘතිය භාවිතා කරන්න.

| ගනුදෙනු අංකය | වත්කම | | | හිමිකම | + | වගකීම |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| ආරම්භක ශේෂ | | | | | | |
| අවසාන ශේෂ | .................. | + ............... | + ............... | = ............... | | + ........................ |

ii) ඉහත ව්‍යාපාරයේ 2018. 01. 31 දිනට පහත සඳහන් දෑ ගණනය කර දක්වන්න.

1) මුළු වත්කම් = රු. ..............................
2) මුළු හිමිකම් = රු. ..............................
3) මුළු වගකීම = රු. ..............................
4) මුදල් ශේෂය = රු. ..............................



Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(2) 1) ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බලපාන කරුණු 2 ක් ලියා දක්වන්න.

1) ..........................................................................

2) ..........................................................................

2) ජයනිගේ ව්‍යාපාරයේ අප්‍රියල් මාසයේ සිදුවූ ගනුදෙණු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| දිනය | වත්කම | | | = | හිමිකම | + වගකීම |
|---|---|---|---|---|---|---|
| | මෝටර් රථ | භාණ්ඩ තොගය | ණයගැති | මුදල් | හිමිකම | ණය හිමියෝ |
| 4.1 දිනට ශේෂ | 500 000 | + 200 000 | | + 200 000 | + 700 000 | + 200 000 |
| 4.3 | | | | + 300 000 | + 300 000 | |
| 4.8 | | + 50 000 | | | | + 50 000 |
| 4.12 | | | | – 50 000 | | – 50 000 |
| 4.17 | + 200 000 | | | | + 200 000 | |
| 4.20 | | – 10 000 | | | – 10 000 | |
| 4.25 | | – 30 000 | | + 45 000 | + 15 000 | |
| 4.27 | | | | + 20 000 | + 20 000 | |
| 4.28 | | | | – 15 000 | – 15 000 | |
| 4.29 | | – 50 000 | + 60 000 | | +10 000 | |
| 4.30 | | | – 10 000 | + 10 000 | | |

ඒ ඒ දිනයන්හි සිදුවී ඇතැයි උපකල්පනය කළ හැකි ගණුදෙනු වටිනාකම් සහිතව ලියා දක්වන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

3) ඉහත සඳහන් ජයනිගේ ව්‍යාපාරයේ 2018. 04. 30 දිනට පහත සඳහන් ශේෂ ගණනය කර දක්වන්න.

1) ජංගම නොවන වත්කම් –

2) ජංගම වත්කම් –

3) මුළු වගකීම් –

4) හිමිකම් –

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

(3) 1) සමිතුගේ ව්‍යාපාරයේ 2018 වර්ෂයට අදාල තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| 2018. 01. 01 දිනට ප්‍රාග්ධනය | 250 000 |
| වර්ෂය තුළ ආදායම් | 60 000 |
| වර්ෂය තුළ වියදම් | 25 000 |
| වර්ෂය තුළ අයිතිකරු යෙදවූ මුදල | 90 000 |
| වර්ෂය තුළ ගැනිලි | 10 000 |

2018. 12. 31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කර දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

2) සමිතුගේ ව්‍යාපාරයේ වර්ෂය තුළ ආදායම රු. 40 000 කින් වැඩි වූයේ නම් අයිතිකරුගේ හිමිකම ගණනය කරන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

3) පහත සඳහන් පද කෙටියෙන් පැහැදිලි කරන්න.

1) බැංකු අයිරාව

........................................................................................................................

2) ගැනිලි

........................................................................................................................

3) ජංගම නොවන වත්කම්

........................................................................................................................

4) ජංගම වගකීම්

........................................................................................................................

Agaram.LK - Keep your dreams alive!